# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1895/4 – 2014 දෙසැම්බර් 30 වැනි අඟහරුවාදා – 2014.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගොඩ උඩසියපත්තු සුළු කොට්ඨාසයේ, ගලහිටියාගම (එෆ්.වී.පී. 60) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක එම්ජ්/පීඑල්එල්/2013/369 හා 2014.04.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර 'ඒ' ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 8.306 ක් පමණ වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කෙන්ට්වත්ත – ප්‍රමාණය: හෙක්. 8.306**

උතුරට: මානින්ගමුව (අ.ග.පි. 48), කැබලි අංක 6 සහ මොනරුවිල (අ.ග.පි. 49); නැගෙනහිරට: මොනරුවිල (අ.ග.පි. 49); දකුණට: මොනරුවිල (අ.ග.පි. 49), මාර්ගය සහ කැබලි අංක 105; බටහිරට: කැබලි අංක 105, මාර්ගය සහ කැබලි අංක 107.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය .

යොමු අංකය: 4-3/15/2013/වීඊ/483.
2014 නොවැම්බර් මස 21 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01 – 389

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩුවෙල මහනගර සභා සීමාව තුළ සුළු කොට්ඨාසයේ, පැලවත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක සීඕ/කේඩීඩබ්ලිව්/2011/1114 හා 2012.03.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ', 'බී' සහ 'කේ' ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 9.5068 ක් පමණ වූ පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – නුගේදෙනිය, මිල්ලගහකුඹුර, නින්දකුඹුර, කජුගහකුඹුර, දිවෙලකුඹුර, ජුවන්දාරගේ කුඹුර, ඇපලවිකුඹුර, විලේකුඹුර – ප්‍රමාණය: හෙක්. 7.3482**

උතුරට: කේ. එල්. පෙරේරා හිමිකම් කියන වරි. අංක 39ඒ, පිල්ලවත්ත, පාර, ඒ. ජේ. එල්. ලලිතා රංජනී සහ තවත් අය හිමිකම් කියන වරි. අංක 28/1, පස්වත්ත; නැගෙනහිරට: ඒ. ජේ. එල්. ලලිතා රංජනී සහ තවත් අය හිමිකම් කියන වරි. අංක 28/1, පස්වත්ත සහ පාර; දකුණට: මාර්ගය (ගම්සභා); බටහිරට: ඇළ.




මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

02. **කැබලි අක්ෂර 'බී' – නුගේදෙනිය, මිල්ලගහකුඹුර, නින්දකුඹුර, කජුගහකුඹුර, දිවෙලකුඹුර, ජුවන්දාරගේ කුඹුර, ඇපලවිකුඹුර, විලේකුඹුර – ප්‍රමාණය: හෙක්. 1.5753**

උතුරට: කැබලි අක්ෂර ජේ සහ ඇළ; නැගෙනහිරට: ඇළ; දකුණට: මාර්ගය (ගම්සභා); බටහිරට: කැබලි අක්ෂර සී, ඩී, ඊ, එච් සහ සුමිත් ගුරුගේ සහ තවත් අය හිමිකම් කියන වරි. අංක 3/70 (5/673) සර්දා උදයානය.

03. **කැබලි අක්ෂර 'කේ' – නුගේදෙනිය, මිල්ලගහකුඹුර, නින්දකුඹුර, කජුගහකුඹුර, දිවෙලකුඹුර, ජුවන්දාරගේ කුඹුර, ඇපලවිකුඹුර, විලේකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.5833**

උතුරට: ඇළ; නැගෙනහිරට: කැබලි අක්ෂර ජේ; දකුණට: සුමිත් ගුරුගේ සහ තවත් අය හිමිකම් කියන වරි. අංක 3/70 (5/673) සර්දා උදයානය; බටහිරට: වැව පහල යාය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය .

මගේ අංකය: 13/97/එල්ආර්බී/360.
මහ කොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතියේ අත්කර ගැනීමේ නිලධාරීගේ අංකය: ජීසීඑෆ්/ඒටීඑච්/කේඩී/23/එල්ආර්.
2014 නොවැම්බර් මස 17 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

01 – 390

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.